# කන්දොස්කිරියාව...



## බෙහෙත් පොහොර නැති ගොයිතැං

මේ අහපං හීං එකෝ, දැං ඔය බේත් පොහොර නොගහ හදන එළවළු වල වස විස නැති හංදා ඒව්වා වැඩි ගානකට දෙන්ට පුළුවන් කියන කතාව ගැන උඹ මොකද කියන්නේ. . .  හොඳයි ඉතිං බේත් පොහොර රටට පුරුදු කරේ කව්ද? මට මතක හැටියට හතලිස් ගනං වල යුද්ධ කාලේ ආණ්ඩුවේ මුලාදෑනිගෝල්ල තමයි ගං වලට ඇවිත් පොහොර නොමිලේ බෙදලා දුන්නේ. කුඹුරු වලට දාන්න. පොහොර දාලා ගොයම හොඳට හැදෙනකොට පණු රෝග වැඩිවුණා. එතකොට පොලිඩෝල් කියල එකක් පුරුදු කරා. ඊට පස්සෙ වලිවාරත්ත පණු බේත් ගං වලට බෝ කරා. . . දැං ඉතිං ආණ්ඩුවේ මුලාදෑනි ඇත්තෝ වස විස නැති ගොයිතැං ගැන කෙඳිරිගානවා. නාහෙට උඩින් වතුර ගැලුවට පස්සේ ඔලුවට උඩින් වතුර ගැලුවට මොකද දැං ඔය ගොයං එළවළු හැම බෝගයක්ම රට පොහොරට පුරුදු වෙලා ඉවරයි. . . .

පොහොර බේත් නොගහ වවන බෝග වලින් වැඩි එළදාවක් ගන්ට අමාරුයි. එළවළු වවලා ලොරි පිටින් කොළඹටයි, දඹුල්ලටයි පටවන උන්දැලාගෙං ඇහුවොත් ඔව්වා ගැන හොඳට විස්තර දැනගන්ට පුළුවන්. දැං අවුරුදු දෙක තුනකට කලිං පන්සලේ පොඩි හාමුදුරුවන්ගේ අප්පොච්චිගේ මරණෙට හේවාහැටේ මාරස්සන පහුකරලා හගුරන්කෙතිං රිකිල්ලගස්ගොඩට ගිය වෙලාවේ යල් කුඹුරු වල එළවළු වගා කරලා තිබුණා දුකේ බෑ. ඒව්වට පොහොර බේත් ගහන්නේ හැටට හැටේ.

තමුංගේ ගෙවල් වලට උවමනා එළවළු බෝග ජාති වලට රට පොහොර, බෙහෙත් ජාති නොගැහැව්වත් මහා පරිමානෙං කරන වගා වලට ඒවා නැතුව බෑ. ඒ කෝක වෙතත් මහපොලොවත් ආරක්ෂා කරගෙන දිරාපත්වනදේ පුළුවන්තරං පොළවට එකතු කරන අතරේ ගස්වැල් වලට උවමනා තරමට විතරක් රට පෝර ජාති දාන්ටත්, පණු රෝග, පුස් රෝග වගාවට බලපාන තරමට ඇති උනොත් විතරක් බෙහෙත් ගහන්ටත්, පුරුදු උනොත් රටට හොඳක් වෙයි.

ගොවිතැන ගැන තියන පැටලිලි ප්‍රස්න විසඳලා දෙන්ට ආණ්ඩුවෙන් පඩිගෙවලා මුලාදෑනි කාණ්ඩයක් පත්කොරල තියනවා. ලඟම තියන ගොවිජන කේන්ද්‍රේට ගෙහුං උන්දලාගෙන් දැනමුතුකම් අහගෙන ගොයිතැං කටයුතු දියුණු කරගන්න උත්සහ ගත්තොත් හොඳයි. එතකොට ඔය වස විස ප්‍රශ්ණ ගැන වැඩිය දඟලන්ට ඕන නෑ. . .

සිලිං අත්තා.

